www.agaram.lk

48679

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම - 2019
ஆண்டிறுதி மதிப்பீடு
Year End Evaluation

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 8 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: I, II |
| | | කාලය / காலம் / Time: පැය 02යි. |

නම:.................................................. විභාග අංකය:..................................................

සැලකිය යුතුයි.
- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- දෙවන කොටසෙහි 01 හා 02 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

- ඉරි ඇඳි යෙදුම්වලට වඩාත් උචිත අර්ථය තෝරන්න.

01. ඇතැම් සේවකයෝ තම ආයතනවල නිලධාරීන් ගොනාට අන්දවමින් සේවා කටයුතු පැහැර හැරීමට උත්සාහ දරති.
1. අමාරුවේ දමා  2. රැකගෙන  3. මුලාකර  4. මගහැර

02. ත්‍රස්තවාදයට උඩගෙඩි දෙන රටවල්, සෙසු රටවල සාමය ගැන කතා කිරීම විහිළුවකි.
1. අනුබල සපයන  2. රැකවරණය සලසන  3. සම්බන්ධ වන  4. මැදිහත් වන

- හිස්තැනට සුදුසු පදය තෝරන්න.

03. පරාස්ස නාට්‍යය, නිෂ්පාදනයට ............................ වූයේ 'ගමරාල සහ යකා' නම් වූ කතාවයි.
1. මූලාශ්‍රය  2. පරිශ්‍රය  3. යෝග්‍යය  4. ආශ්‍රමය

04. කතරගම මහ පෙරහැර නරඹන විදේශිකයෝ ............................ වෙති.
1. විස්මිත  2. විලම්බිත  3. වශීකෘත  4. දොම්නස්

05. පහත සඳහන් වැකි අතුරින් නිවැරදි වාක්‍යය තෝරන්න.
1. ඔහුත් ඇයත් තරගය ජය ගනිති.
2. ගංගාවන් නොනැවතී මුහුදට ගලා බසිති.
3. නාවිකයා විසින් සේවකයින්ට අනතුරු හඟවයි.
4. සිසුහු ගුරුවරු හමුවූහ.

06. උපසර්ග පදයක් ඇතුළත් නොවන පිළිතුර වන්නේ,
1. සුරත්, දුසිරිත්, ප්‍රබල
2. අසෝෂ, අවනම්බු, නිසරු
3. නිදොස්, නුහුරු, නිශ්චල
4. කුදිටු, විරාග, අසිරි

- ඉදිරියෙන් දී ඇති ව්‍යාකරණ ගණයට අයත් නොවන පදයක් සහිත පද පේළිය තෝරන්න.

07.
1. යුගල පද - තාඩන පීඩන, අඬුම කුඩුම, කවා පොවා
2. සර්ව නාම පද - අපි, තොපි, ඔබ
3. අනියමාර්ථ නාම පද - ඇතෙක්, ගසක්, මිනිසෙක්
4. බහ්වර්ථ පද - පිය, නා, තිර

08. A - මනා සේ රැක ගැනීම  B - සුපරීක්ෂාකාරීව බැලීම
ඉහත A හා B සඳහා යෙදිය හැකි තනි පද වන්නේ,
1. A - අනුමානය, B - ගවේෂණය
2. A - සංරක්ෂණය, B - පර්යේෂණය
3. A - විරාගත, B - නිරීක්ෂණය
4. A - සංරක්ෂණය, B - නිරීක්ෂණය



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

09. ''හිල් කුඩෙන් වතුර අදිනවා වගේ'' යන පිරුළෙන් ප්‍රකාශ වන්නේ,
1. නිෂ්ඵල කාර්යයකට වෙහෙසීමකි.
2. උත්සාහවන්තයා ජය ගන්නා බවකි.
3. අවදානම් ක්‍රියාවක යෙදීමකි.
4. අසීරු ක්‍රියාවක් කිරීමකි.

10. ළමයෙක්, කුරුල්ලෝ යන පදවල අනුක්ත පද වන්නේ,
1. ළමයා, කුරුල්ලෙක්
2. ළමයි, කුරුල්ලන්
3. ළමයෙකු, කුරුල්ලන්
4. ළමයකු, කුරුල්ලෙක්

11. A - විධි ක්‍රියා = ලියා
B - ආශිර්වාද ක්‍රියා = දෙනු මැනවි
C - මිශ්‍ර ක්‍රියා = නටනටා
D - පූර්ව ක්‍රියා = සැනසේවා
ඉහත ප්‍රකාශ අනුව නිවැරදි ව ගැළපෙන ක්‍රියා පද වර්ගය වන්නේ,
1. A ය.
2. C ය.
3. B ය.
4. D ය.

12. පහත සඳහන් පිළිතුරුවල ක්‍රියා නාමයක් හා ගුණ නාමයක් වන්නේ,
1. ලස්සන - නපුරු
2. කැවුම් - පුටුව
3. පුටුව - ලස්සන
4. කැවුම් - ලස්සන

13. පහත සඳහන් පද අකාරාදී පිළිවෙළට සැකසූ විට, අවසානයට යෙදෙන පදය කුමක් ද?
දෙව්නුවර, දික්වැල්ල, දොම්පෙ, දඩල්ල, දූරණියගල,
1. දික්වැල්ල
2. දඩල්ල
3. දොම්පෙ
4. දෙව්නුවර හෝ දූරණියගල

14. මහා සිංහල ශබ්දකෝෂයේ ඇතුළත්වන 'කිරි පුබ්බරු' යනු කුමක් ද?
1. කිරි ගොටුව
2. කිරිබත්
3. කිරි බඳුන
4. කිරි කොස්

15. ''යම් ප්‍රකාශයක් වැඩිදුරටත් පැහැදිලි කිරීමේ දී සරල වරහන් භාවිත වෙයි''.
ඉහත සඳහන් ප්‍රකාශය,
1. අසත්‍යයකි.
2. අර්ධ සත්‍යයකි.
3. අර්ධ අසත්‍යයකි.
4. සත්‍යයකි.

16. පහත සඳහන් වචනවල හිස්තැනට ගැළපෙන අක්ෂර පිළිවෙළින් යෙදී ඇති පේළිය සොයන්න.
....න්දය, සාම්ප්‍ර....යික, නිෂ්....ල, උච්....රණ
1. ඡ, දා, එ, චා
2. ච, ධා, ඵ, ඡා
3. ඡ, ධා, ප, චා
4. ච, දා, ඵ, ඡා

17. මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථයක් දෙන පදය සහිත යෙදුම වන්නේ,
1. බහුල - බොහෝ, වැඩි, සුලබ, ගොඩක්
2. සතුට - ප්‍රීතිය සොම්නස, සිනහව, තුට
3. පිරුණ - නොමඳ, අනල්ප, බහුල, ජලය
4. ආලෝකය - ප්‍රභාතය, අලු, තිමිර, එළිය

18. වෙන වෙන හොඳ පාට ඇඳුම්
ඇඳගත් පොඩි ළමයි පෙළක්
වගෙයි නේද මේ ගස් ටික
නොයෙක් පාට මල් පිපිලා
ඉහත නිර්මාණයෙහි ඇතුළත් උපමේය හා උපමාව වන්නේ,
1. පාට පාට ගස් - පාට පාට ළමයින්
2. ගස්වල නොයෙක් පාට මල් - නොයෙක් පාට ඇඳුම් ඇඳි ළමයින්
3. පාට පාට ඇඳුම් - පාට පාට මල්
4. නොයෙක් පාට ඇඳුම් ඇඳි ළමයින් - ගස්වල නොයෙක් පාට මල්

19. ''රකුසු මුව ඇති කාළභීෂණ පෙන තුනක් හිස දරාලා
දකුණු අතිනුත් රැගෙන මුගුරක් මහත් ඇස් ඉස් රවාලා''
ඉහත නිර්මාණය තුළින් ගම්‍ය වන රසය නම්,
1. බීභත්ස්‍ය රසය
2. හාස්‍ය රසය
3. වීර රසය
4. රෞද්‍ර රසය

20. එස්. මහින්ද හිමියන්ගේ හා ඒ. පී. ගුණරත්න නිර්මාණ කරුවන්ගේ කෘති දෙකක් වන්නේ,
1. ආවර්ජනා - කච්මිණ
2. දරු නැළවිල්ල - රන් කැකිර හා තවත් කතා
3. කච්මිණ - දරු නැළවිල්ල
4. ආවර්ජනා - කච්මිණ

(ලකුණු 02 × 20 = 40)



agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

## II කොටස

- 01 හා 02 ප්‍රශ්නවලට පිළිතුරු ලිවීම අනිවාර්ය වේ.
- 03, 04, 05, 06, 07 ප්‍රශ්නවලින් **තුනක්** තෝරා ගෙන ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න.

01. ඉගෙනුම් අවස්ථාවක් ලෙස 'ප්‍රස්තාව පිරුළු' හා 'ජන කතා' කිහිපයක් ඇසුරින් පොත් පිංචක් සැකසීමට ඔබට සිදු වෙයි.
ඒ ඇසුරින් පිළිතුරු ලියන්න.
(i) මෙම පොත සැකසීමට ගුරුභවතාගෙන් ලැබුණු උපදෙස් **දෙකක්** ලියන්න. (ල. 02)
(ii) පොත් පිංච නිර්මාණයට තොරතුරු සොයා ගත් මූලාශ්‍ර **තුනක්** සඳහන් කරන්න. (ල. 03)
(iii) ඔබ තෝරා ගත් ප්‍රස්තාව පිරුළක් හා ජනකතාවක් නම් කරන්න. (ල. 02)
(iv) ක්‍රියාකාරකම සිදු කිරීමේ දී ඔබට සහය වූ තිදෙනෙකු නම් කරන්න. (ල. 03)
(v) මෙම ක්‍රියාකාරකම තුළ ඔබ මුහුණ දුන් ගැටලු **තුනක්** ලියන්න. (ල. 03)
(vi) පොත් පිංච නිර්මාණය කිරීමෙන් ලද ප්‍රයෝජන **තුනක්** ලියන්න. (ල. 03)
(මුළු ලකුණු 16)

02. පහත සඳහන් මාතෘකාවලින් **එකක්** තෝරා ගෙන වචන 150කට නො අඩු වන සේ රචනයක් ලියන්න.
(i) තේරවිලි කවි රස විඳිමු.
(ii) බෝ නොවන රෝග වළක්වමු.
(iii) මා සිත් ගත් වීර චරිතය.
(iv) පරිසරය - තාක්ෂණය හා මිනිසා.
(v) අපූරු සිහිනයක් දුටුවෙමි.
(ලකුණු 14)

03. (අ) දිනය :- 2019. 11. 29
වේලාව :- පෙ. ව. 8.30
ස්ථානය :- විද්‍යාලයීය ප්‍රධාන ශාලාව
ප්‍රධාන අමුත්තා :- කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ
ඉහත තොරතුරු ආශ්‍රය කර ගනිමින්, ඔබ පාසලේ පැවැත්වීමට සූදානම් කර ඇති වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවයට දෙමාපියන් සහභාගි කර ගැනීම සඳහා සුදුසු ආරාධනා පත්‍රය සකස් කරන්න.
(ලකුණු 10)

නැතහොත්

(ආ) 'නීලගම' ගමට ගැටලුවක් ව තිබුණු, පානීය ජල හිඟය නිමා කරමින්, නව ව්‍යාපෘතියක් "සිසිල" නමින් ආරම්භ කිරීමට නියමිත ය. 2019. 11. 30 දින පෙ. ව. 9.00ට පානීය ජල ව්‍යාපෘතිය විවෘත කෙරෙයි. නීලගම ළමා ප්‍රජා සංගමයේ ලේකම් ඔබ යැයි සිතන්න. එම අවස්ථාවට ප්‍රධාන 'ආරාධිතයා' ලෙස සහභාගී වීමට පැමිණෙන ලෙස දන්වා, නීලගම ප්‍රාදේශීය ලේකම්තුමාට යවන ලිපිය ලියන්න.
(ලකුණු 10)

04. පහත සඳහන් ප්‍රශ්නවලට, පෙළ පොත ඇසුරින් පිළිතුරු සපයන්න.
(i) "මගේ ඇඟත් ටිකක් හීතල කරගෙන එනව වගේ බොල".
(අ) මෙසේ ප්‍රකාශ කළේ කවුරුන් ද?
(ආ) එම ප්‍රකාශය කළේ කාහට ද?
(ii) "කර්මාන්තයට අවශ්‍ය අලි වසුරු ලබා ගැනෙන්නේ පින්නවල අලි අනාථාගාරයෙනි".
(අ) මෙම කොටස උපුටා ගත් පාඩම කුමක් ද?
(ආ) ඉහත ලිපිය රචනා කළේ කවුරුන් ද?
(iii) "එහෙනම් ඒක ගන්න හැදුවේ? පලයන් යන්න....."
(අ) මෙසේ ප්‍රකාශ කළේ කාට ද?
(ආ) මෙහි සඳහන් 'ඒක' කුමක් ද?
(iv) "අද නැවාම ආයේ නාන්න තියෙන්නේ තව දවස් දෙකකින්".
(අ) මෙම කොටස උපුටා ගත් පාඩම කුමක් ද?
(ආ) මේ ප්‍රකාශය කරන්නේ කවුරුන් ද?
(v) "ඔන්න සාස්තරේ හරියට කියවීගෙන එනවා නේද?"
(අ) මෙම ප්‍රකාශය කාගේ ද?
(ආ) ඒ ප්‍රකාශය අසා සිටින්නේ කවුරුන් ද?
(ලකුණු 02 × 05 = 10)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

05. පහත සඳහන් කවිවලට සුදුසු ඉතිරි පද දෙක නිර්මාණය කරන්න.

(i) නිසසල රෑ සසල කරන් උලමෙක් හඬ දෙන්නේ
සඳ හැංගිලා වලාකුළක තරු නොපෙනී යන්නේ
..........................................................................................
..........................................................................................

(ii) ..........................................................................................
..........................................................................................
පතළ නැතත් නුඹෙ නාමය මුළු ලොවට
කිරුළු නොමැති ගුරු සඳ නුඹ මගෙ ලොවට

(iii) පොත පත කියවමින් දැනුමෙන් සරුවෙන්න
..........................................................................................
..........................................................................................
රට දැය සමය තම දිවි සේ සුරකින්න

(iv) ඉව්වා අප වැල්ලෙත් බත
බෙදා කැන්ද කොළයක් මත
..........................................................................................
..........................................................................................

(v) ..........................................................................................
..........................................................................................
සෙල්ලම් කඩයක් දම්මා
ගෙන්නාගෙන ලොකු අම්මා (ලකුණු 02 × 05 = 10

06. හිස්තැනට සුදුසු පදය වරහන් තුළින් තෝරන්න. ( 'අ' සහ 'ආ' කොටස් දෙකට ම පිළිතුරු ලිවිය යුතුයි

(අ) (i) අයියාත් අක්කාත් අද දින විදේශගත ..................... (වෙයි / වෙති)
(ii) ළමයි පෙළ ත්‍යාග උත්සවයට ..................... (පැමිණය හ / පැමිණියේ ය)
(iii) රජතුමාණෝ උයන් කෙළියට ..................... (යයි / යති)
(iv) සමහරු වැඩිහිටියන් දෙන ඔවදන් හොඳින් ..................... (පිළිගත් හ / පිළිගත්තේ ය)
(v) සරුංගල් සමූහය අහසේ ඉහළට ඇදී ..................... (යති / යයි) (ලකුණු 01 × 05 = 05)

(ආ) පහත ඡේදය කියවා එහි මූලික අදහස තනි වාක්‍යයකින් ලියන්න. (වචන 10 - 16ත් අතර සෑහේ)

"මදුරුවා බොහෝ විට ඔබේ කන අසලට පැමිණ කරදරකාරී ලෙස ශබ්ද නගයි. ඌ නගන ශබ්දය ජනිත වන්නේ අත්තටු වේගයෙන් චලනය වීමෙනි. අප ශරීරයේ කන්පෙති ඇති ස්ථානයේ සම ඉතා සිනිඳු වීම නිසා ඒ ස්ථානයේ තාපය වැඩියෙන් පිටවීම සිදු වෙයි. තාපය වැඩි ස්ථානයේ ලේ ප්‍රමාණය අධික බව උත්පත්තියෙන් ම මදුරුවා දනී." (ලකුණු 05)

07. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

ලෝකයේ අනාගත බලශක්ති අර්බුදය නිසා ජීව ඉන්ධන සඳහා නව ආදේශකයක් සොයා ගැනීම හ එලදායී ලෙස යොදා ගැනීම සඳහා පර්යේෂණ කිරීම කෙරෙහි අති විශාල අවධානයක් යොමු වී තිබේ විද්‍යාඥයින්ගේ අවධානයට අලුතෙන් ම ලක් වී තිබෙන්නේ, ගොවිපළ නිෂ්පාදනයක් වන, අප කැ 'බටර්' ය. පරිසර හිතකාමී ජීව ඉන්ධන නිපදවීම සඳහා අමුද්‍රව්‍යයක් ලෙස "බටර්" යොදා ගත හැකි බ පැවසෙයි. තෙල් කාන්දුව, ඛණිජ තෙල් මිල උච්චාවචනය, තෙල් නිධි අසීමාන්තිකව පරිහරණය නිස තෙල් නිධි ශීඝ්‍රයෙන් ක්ෂය වී යමින් තිබේ. අනාගතයේ දී මුළු ලෝකයට ම බලපාන ඉන්ධන හිඟයක් ඇ වීමට නියමිත ය. තෙල් මිල අධික ලෙස ඉහළ යාමත්, ජීව ඉන්ධන හා වෙනත් විකල්ප කෙරෙහි වැ අවධානයත් තවත් හේතු වී ඇත. ඒ අනුව බඩ ඉරිඟු, උක්, ධාන්‍ය වර්ග වැනි ස්වාභාවික බෝග ජීව වා මෙන් ම තවත් අතිරේක ද්‍රව්‍යවලින් ජීව ඉන්ධන නිපදවා ගැනීම පිළිබඳව බොහෝ පර්යේෂණ සිදුවෙමි පවතියි.

(i) ඡේදයෙන් මතු කරන අර්බුදය කුමක් ද?
(ii) ජීව ඉන්ධන අමුද්‍රව්‍යයන් ලෙස මෙහි සඳහන් වර්ග දෙකක් නම් කරන්න.
(iii) වර්තමානය වනවිට ජීව ඉන්ධන කෙරෙහි වැඩි අවධානයක් යොමු වන්නේ ඇයි?
(iv) ඡේදයට අනුව, තෙල් නිධි ශීඝ්‍රයෙන් ක්ෂය වන්නේ කුමක් නිසා ද?
(v) අර්ථ දක්වන්න.
(අ) ආදේශක = ................................ (ආ) අසීමාන්තික = ................................
(ලකුණු 02 × 05 = 10



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk